# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
## COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. • த. பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7. • P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2596365, 2596360/1954 ෆැක්ස් / பெக்ஸ் / Fax: 2595045


මගේ අංකය :BC/PRV/11/01/GOV/03

2024.08.6

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් පාලන ආයතනවල කොමසාරිස්වරුන්, ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ආණ්ඩුකාර ලේකම්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්,
රජයේ සියලු සංස්ථා,මණ්ඩල, ව්‍යවස්ථාපිත අධිකාරීන් සහ රාජ්‍ය සමාගම් ප්‍රධානීන්,

**අයථා ලෙස පුද්ගලික පරිහරණයේ තබාගෙන සිටින රජයේ නිශ්චල,චංචල දේපළ යළි භාරදීම සම්බන්ධවයි.**

පූර්වයෙන් රජයේ තනතුරු හෝ පදවි දරමින් සිටිය දී රජය මගින් ලබා දුන් නිශ්චල, චංචල දේපළ එම නිලතලවලින් ඉවත් වූ පසු නීත්‍යනුකූල නොවන ආකාරයට පරිහරණය කරන බවට වරින්වර මෙම කොමිෂන් සභාවට පැමිණිලි ලැබෙමින් පවතී.

02. ඒ අනුව, එලෙස එම නිශ්චල, චංචල දේපළ තව දුරටත් පරිහරණය කරන අයවලුන් වේ නම් ,අදාළ දේපළ නැවත කඩිනමින් ආපසු භාර දීම අදාළ පුද්ගලයන්ගේ වගකීම වන අතර, එසේ ම එම රජයේ දේපළ පිළිබඳ සොයා බල ඒවා කඩිනමින් ආපසු භාර ගැනීමට අවශ්‍ය කටයුතු අදාළ වගකිවයුතු නිලධාරීන් විසින් සිදු කළ යුතු වේ.

03. මෙසේ කිසියම් පුද්ගලයෙකු තවදුරටත් නීත්‍යානුකූලව අදාළ නිශ්චල, චංචල දේපළ රජය වෙත භාර දෙනු නොලැබීම, නීතිය හමුවේ දඬුවම් ලැබිය හැකි වරදක් වන අතර, අදාළ රජයේ වගකිව යුතු නිලධාරීන් තම ආයතනවලට අයත් එම දේපළ නිසි පරිදි භාර ගැනීමට/අත්පත් කර ගැනීමට සහ ඉන්වෙන්ට්‍රිගත පරිදි පවත්වා ගෙන යාම ප්‍රධාන වගකීමක් වේ.

04. එසේ ම, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 41 සහ 111 වගන්ති ප්‍රකාරව සහ (අ) සහ (ආ) උපලේඛන කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

05. මෙය 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ බලතල ප්‍රකාරව කොමිෂන් සභාවේ නියමය පරිදි ඔබ වෙත දන්වනු ලැබේ.

ඩබ්.කේ.ඩී.විජේරත්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

01.ජනාධිපති ලේකම්
02.අග්‍රාමාත්‍ය ලේකම්
03.අමාත්‍ය මණ්ඩල ලේකම්
04.විගණකාධිපති
05.අධ්‍යක්ෂ ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව

CamScanner